යම් පුවතකට සෘජුව අදාළ නොවන්නේ නම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය පිළිබඳ විස්තර ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුතු බව, ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් ප්‍රකාශයට පත් කර ඇති මාධ්‍ය සඳහා වන වෘත්තිය ප්‍රතිපත්ති මාලාවේ දැක්වේ. නමුත් "බදුලු කෝච්චිය පෙරළලා රටම හඬවන්න හදපු නරුමයෝ" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා මව්බිම පුවත්පතේ පළවී ඇති ලිපිය තුළ, සැකකරුවන් පස් දෙනාගෙන් එක් අයෙකු ද්‍රවිඩ ජාතිකයෙකු බව සඳහන් කර ඇත.

මෙහිදී, මෙම සැකකරුගේ වාර්ගිකත්වය මෙම ප්‍රවෘත්තියට අදාළ වන්නේ කෙසේද? සැකකරුවන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුගේ පමණක් වාර්ගිකත්වය පුවත් වාර්තාව තුළ දැක්වීමේ පදනම කුමක්ද? එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීමක් නොවේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayMawbima**